නැතිවුණා. අනික් එක් පුතෙක් හා දුව මෙහේ ජීවත්වෙනවා. දුව ඕස්ට්‍රේලියාවෙ ඒ.බී.සී. ගුවන් විදුලියෙ නිශ්පාදකවරියක්. අනෙක් පුතා මේ දිනවල දිල්ලියේ කොන්සල්වරයා වශයෙන් සේවය කරනවා.

**"මාධ්‍ය දිවියට මුලින්ම සම්බන්ධවීම ගැන කතා කළොත්."**

කොමියුනිස්ට් පක්ෂයේ මුල්ම ජනශක්තිය පත්තරේ කතෘ විදියට වැඩකරපු දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ හිරේට ගියාට පස්සේ, ඒකෙ වැඩකටයුතු මට පැවරුණා. එතකොට මගේ වයස අවුරුදු 20. ඊටපස්සෙ 1944 දී පත්තරෙන් ඉවත්වෙලා කටුගස්තොට රාහුල විද්‍යාලයේ ගුරුවරයෙක් හැටියට සේවය කළා. පසුව 1948 දී ලේක්හවුස් ආයතනයේ දිනමිණ පත්තරේ උප කතෘවරයෙක් හැටියටත් ඔබ්සර්වර් පත්තරේ වාර්තාකරුවෙකු හැටියටත් රස්සාව කළා. ගුවන්විදුලියට සම්බන්ධ වීම ගැන කතා කළොත් 1950 දී ධාතූන් වහන්සේලා වැඩමවීම වාර්තා කිරීමට ඒ වෙනුවෙන් බුරුමයට ගියා. ඊටපසු 1951 දී ගුවන් විදුලි නිබන්ධ සම්පාදක තනතුරක් ලැබුනා. මට ඒ තනතුර ලැබෙනකොට එච්.එම්. ගුණසේකර, කරුණාරත්න අබේසේකර, සිරිසෝම ජයසිංහ වගේ අය තමයි හිටපු ජ්‍යෙෂ්ඨයෝ.

පියසේන අන්කල්, අපේ රටේ ප්‍රථම විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ මාධ්‍ය ලේකම් ලෙස එකල කලක් කටයුතු කළා. එනමුත් ඔහු විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ කළකිරීමෙන් සිටි කෙනෙක්. එම අතීතය සිහිපත් කළොත්.

අනවශ්‍ය ලෙස බටහිර ගැතිවී ඉන්දියාව අමනාප කර නොගන්නා ලෙස මම එතුමාට කිහිපවරක්ම පෙන්නුම් කරලා දීලා තියෙනවා. මම කිව්වෙ ඉන්දියාවෙ සහය නැතිව එල් ටී ටී ප්‍රශ්නෙ විසඳන්න බැහැ කියලා. අනෙක ලොවේ කිසිම රටක් ඉන්දියාවෙ සහය නැතිව මේ ප්‍රශ්නෙ විසඳන්න අපට පක්ෂ වෙන්නෙ නැහැ කියන තැන තමයි මම හිටියෙ. එදා ඒවට තදින් විරුද්ධ වුනේ ගාමිණී දිසානායක මහත්තයා. පසුව ඉන්දු ලංකා ගිවිසුමේ ප්‍රධාන භූමිකාව වුනෙත් එතුමා තමයි. අනෙක 1982 ජනමත විචාරණය. එතැනදී ආර්. ප්‍රේමදාස මහත්තයත් මමත් අතර ප්‍රබල වාදයක් පවා ඇති වුණා. ඒ අත්තනගල්ල ඡන්ද ප්‍රතිඵලය පිළිබඳව. මොකද ? ඊට සුළු කලකට ඉහතදී ඡන්ද 10,000කින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනපු අත්තනගල්ල ආසනය හොර



*දේවගොඩ ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ ධර්මශාලා ගොඩනැගිල්ලට මුල්ගල් තැබීමේ උත්සවයේදී අමාත්‍ය කුමාර වෙල්ගම මහතා සමග පහන දල්වමින්*

ඡන්ද බුරුතු පිටින් දාලා පරද්දලා තිබුණා. මම කිව්ව මේ ප්‍රතිඵලය ලොවේ කවුරුත් පිළිගන්නෙ නහැ. ඒක අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදෙට ලැබෙන කළු පැල්ලමක් කියලා.

**ඔබ රාජපක්ෂ පරපුරත් ළඟින් ඇසුරු කළ කෙනෙක්. අතීතයත්, වර්තමානයත් පිළිබඳව විග්‍රහ කර බැලුවොත් මහින්ද රජය යන ගමන් මඟ හරිද ?**

මට මුලින්ම කියන්න ඕනෙ අපේ රටට අද ප්‍රබල විපක්ෂයක් අවශ්‍ය බව. මොකද එදා 77දීත් ප්‍රබල විපක්ෂයක් නැති කමින් තමයි අපේ රට විනාශ මුඛයට ගියේ. ඒවගේම අපක්ෂපාතී ජනමාධ්‍යය. අද මහින්ද රාජපක්ෂ රජ්ජුරුවන්ට කියලා, ප්‍රශස්ති ගී ගායනා කරලා ලාභ ප්‍රයෝජන ලබාගන්න මාන බාලන මාධ්‍යකරුවො වැඩියි. ඒවගේම දියුණු තාක්ෂණය නිසා අන්තර්ජාල හරහා බොරු බේගල් පතුරුවන නින්දිත අයුරින් මාධ්‍යය හසුරුවන මාධ්‍යකරුවොත් වැහිවැහැල. මැදුම් පිළිවෙත අනුගමනය කරමින් ඇත්ත පැහැදිලි කරලා රජයට කරුණු කාරණා පැහැදිලි කරන මාධ්‍යකරුවන් අතලොස්සයි ඉන්නෙ. අනෙක යුද්ධය දිනුවා කියල උදම් අන අනා ඉන්නවා වෙනුවට දෙමළ වාර්ගික ප්‍රශ්නය වෙනුවෙන් විසඳුමක් දීමට තවමත් රජය අපොහොසත් වෙලා ඉන්නවා. ඔය දෙමළ ඩයස් පෝරා සියල්ල නිහඬ කරන්නට පුළුවන් එකම විසඳුම තමයි සියල්ල පිළිගත හැකි සාධාරණ විසඳුමකට එළඹීම. අනෙක තුවක්කු සංස්කෘතිය. බොහෝ මැති ඇමැතිවරු පිරිසක් විනයගරුකව හැසිරුනත් සුළු දෙනෙක් තවමත් හැසිරෙන්නේ කැලෑ නීතිය රජ කරමින් ඔවුන්ට වැසිකිළියට යන්නටත් ඉක්මන් විසඳුමක් නොදුන්නොත්, එසේම මනාප පොරය අවසන් කරල කේවල ක්‍රමයක් නොගෙනාවොත් ලබාගත්තු යුධ ජයග්‍රහණ පළක් නොවෙන්න පුළුවන්.

**එතකොට ඔබ හිතන්නේ රාජපක්ෂ රජය මේ විසඳුම්වලට ළඟවෙයි කියලද ?**

මං හිතන්නෙ තවමත් කල් තියෙනවා. ඒ වගේම මහින්ද මහත්තයට ඒ පිළිබඳව අධිෂ්ඨානයකුත් තියෙනවා. එහෙත් ඔහු යම් යම් බාධකවලට හිරවෙලා කියලයි මගේ හැඟීම. ඒ බාධක මැඩගෙන, සුළු වාසි අමතක කරල රට වෙනුවෙන් හරි තීරණ ගත්තොත් පරාද වුනත් රටට වෙන යහපත ඉමහත්.

**"ඔබ ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත් පත් ගුවන් විදුලි මාධ්‍ය ගැන කුමක්ද හිතන්නෙ."**



*නවරගහලේදී පැවති පිලිප් ගුණවර්ධන අනුස්මරණ උළෙලේ දී පියසේන මහතා අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන නිමල් සිරිපාල ද සිල්වා මහාචාර්ය කිරිවන්දෙනිය යන මහතුන් සමග වේදිකාවේ*

බොහොම සුළු මාධ්‍යවේදීන් පිරිසක් ඉන්නවා. බොහොම නිර්භීත එඩිතරව නිවැරදිව අදහස් ප්‍රකාශ කරන ඔවුන්ගේ සමහර ලිපි කියවනකොට මට හිතෙනවා මේවා ලංකාවෙ පත්තරවල පළවුනානම් කොච්චර හොඳද කියලා. එහෙත් ලියන්නන් වාගේ ඔහේ ලියන පිරිස වැඩියි. එසේම සමහර අය වෙන්වෙලා ඉන්නෙ ප්‍රශස්ති ගී ගායනා කරන්න. පත්තර කලාව නොදැන පත්තරවලට බැස්සම වෙන අසාර්ථකත්වය ඔවුන් දන්නෙ නැහැ.

අද ගෙවන ජීවිතය සමඟින් අතීතය දිහා හැරිලා බැලුවහොත ?

මම තෘප්තිමත්, අද මගේ ලංකාවේ සමහර දේපළ පවා මට අයිති නැහැ. ඒවා එක එක්කෙනා අයිතිකරගෙන. එහෙත් මම ඒවට දුක්වෙන පුද්ගලයෙක් නෙවෙයි. ඒ සියල්ල නැතිවුනත් මගේ දැනුම මට නැතිවෙලා නැහැ. අන්තිමේදී මම හම්බ කගේ ඒ දැනුම විතරයි. ඒ ගැන හිතනකොට මට හරි සතුටුයි.

**අද මාධ්‍යවේදීන්ට පියසේන අන්කල් ලබාදෙන පණිවිඩය කුමක්ද ?**

පුළුවන්තරම් නවීන ලෝකය හා සම්බන්ධ වෙලා හොඳින් කියවලා පරිණත වෙන්න ප්‍රශස්ති වාක්‍ය රචනාවලින් වැළකිල නිර්ව්‍යාජ මධ්‍යස්ථ අවංක මාධ්‍යවේදියකු වන්න. එසේම ඔබේ වස්තු සම්භාරය කවුරු හෝ සොරකම් කලත් දැනුම සොරකම් කරන්න බැහැ. එසේම මාධ්‍යවේදියෙකුට හොඳ භාෂා හැසිරීමකුත් එම පෑන නිසි ලෙස හැසිරීමට හොඳ කශේරුකාවකුත් තිබිය යුතුයි. ප්‍රවීනත්වය හා නොබිය කියන්නේ ඒකට. අමරණීයත්වයට පත්වී ජනතාව ගරු කරන්නේ එවැනි පුද්ගලයන්ට.

"එහෙනම් අන්කල් අපි ආයෙ මුණගැහෙමු." ඔහු නිහඬව සිනාසිණි.

බොහෝ සරල, නිර්ව්‍යාජ, ගැමිකම අමතක නොකළ එම සුන්දර මිනිසාගෙන් මා සමුගන්නා විට රාත්‍රී නවය පසු වී තිබිණි. ඔහුට මම සුභ රාත්‍රියක් පැතුවේ නැත. ඒ හිත් නිදහස් මිනිසකුට හැම රාත්‍රියක්ම සුභ බැවිනි. ■


